www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කැරලිකරුවන් 1000ක් අත් අඩංගුවට ගැනීමට බංගලිදේශ ආන්ඩුව අනුමැතිය දෙයි

## Bangladeshi government authorises arrest of 1,000 mutineers

**සරත් කුමාර විසිනි**
**2009 මාර්තු 5**

රාජ්‍ය සමාවක් පිලිබඳ දුන් පොරොන්දු පසෙක දමා, පසුගිය සතියේ කැරැල්ල දියත් කරමින් තම හමුදා නායකයින් ඝාතනය කල බංගලිදේශ රයිෆල් සාමාජිකයින්ට (බී.ඩී.ආර්) එරෙහිව බංගලිදේශ ආන්ඩුව දැවැන්ත දඩයමක් ආරම්භ කර ඇත. කැරලිකාර හමුදාභටයින්ට යටත් වීම සඳහා පැය 34 ක් ලබා දී ඇති බවත්, ''ඔපරේෂන් රිබෙල් හන්ට්'' (කැරලි කරුවන් දඩයම් කිරීමේ මෙහෙයුම) ක්‍රියාන්විතය ආරම්භ කිරීමට හමුදාවට නිර්දේශ කල බවත් අගමැතිනිය ෂීක් හසීනා සඳුදා දින පාර්ලිමේන්තුවට පැවසුවාය.

බීඩීආර් සාමාජිකයින් 1000 අත් අඩංගුවට ගැනීම සඳහා වරෙන්තු නිකුත්කරනු ලැබ ඇත. හසීනාට අනුව (කැරලිකරවන්ට) කාර් සහ බෝට්ටු මගින් පලායාමට සැලසූ බීඩීආර් ආධාර කරුවන් සඳහා ද වරෙන්තු නිකුත් කර ඇත. ඉවක් බවක් නැතිව සිදු කෙරෙන අත් අඩංගුවට ගැනීම් සහ නීතියට පිටින් සිදු කෙරෙන ඝාතන සඳහා නම් දරා සිටින හමුදාවේ හදිසි ක්‍රියාත්මක බල ඇනිය (ආර්ඒබී) සමග පොලීසිය බීඩීආර් භටයින් වෙත කඩා පැනීම සඳහා යොදා ඇත.

මාධ්‍ය වර්තාවලට අනුව ඊයේ වන විට, කල්ලි නායකයින් ලෙස හංවඩු ගසනු ලැබූ බීඩීආර් භටයින් හය දෙනෙකු ඇතුලුව, 700ක් පමන අත් අඩංගුවට ගෙන ඇත.

පසුගිය සතියේ අගමැතිනිය සමග සාකච්ඡා මෙහෙය වූ බීඩීආර් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු වන තොහිදුල් අලම් කැරලි නායකයා බවට ඇඟිල්ල දිගු කර ඇත. රටේ දේශසීමා ආරක්ෂක බලකාය ලෙස ක්‍රියා කරන බීඩීආර් බලඇනිය පාලනය කරනු ලබන්නේ හමුදාව විසිනි.

ඝාතන, අවි ආයුධ පුපුරන ද්‍රව්‍ය භාවිතා කිරීම, නිලධාරීන් සහ සිවිල් ජනයා මැරීමට කුමන්ත්‍රන කිරීම, සංත්‍රාසය ඇති කිරීම, මෘත ශරීර සැඟවීම සහ කොල්ල කෑම ඇතුලු දීර්ඝ චෝදනා ලැයිස්තුවකට රැඳවියන් මුහුන දී සිටිති.

පසුගිය සිකුරාදා අගමැතිනිය හසීනා සහ හමුදා නායක ජෙනරාල් මොයින් යූ. අහමඩ් අතර පැවැති සාකච්ඡාවකින් අනතුරුව, බීඩීආර් භටයින් සම්බන්ධ නඩුවිභාග කිරීම සඳහා විශේෂ අධිකරන පිහිටුවූ බව ආන්ඩුව පැවසුවේ ය. හමුදා ප්‍රකාශක ලුතිනන් ජෙනරාල් මුහම්මද් අබ්දුල් මුබින් ''ආදර්ශමත් දඬුවම් පැමින වීම'' බලාපොරොත්තු වන බව පැවසුවේ ය.

ඩකා අගනුවර තම මූලස්ථානයෙහි පාලනය ලබා ගනිමින් ද තම හමුදා නායකයින් ප්‍රාන ඇපකරුවන් ලෙස තබා ගනිමින් ද පෙබරවාරි 25 දින බීඩීආර් සාමාජිකයෝ කැරලි ගැසූහ. ඉහල වැටුප්, සහ හමුදාවේ අයට සමානව ආහාර සලාක ලබාදීම ඔවුන්ගේ ඉල්ලීම් ලැයිස්තුවට ඇතුලත්ය. දෙවන ගනයේ කන්ඩායමක් ලෙස තමන් සලකනු ලැබීම ගැන කලකිරුනු ඔවුහු ඉහල තනතුරුවලට හමුදා නිලධාරීන් පත් කිරීම නවත්වන ලෙසත්, වඩාත් වාසි සහගත එක්සත් ජාතීන්ගේ විදේශීය මෙහෙයුම්වල සේවය කිරීමේ අයිතිය ද ලබා දෙන ලෙස ඉල්ලූහ.

අගමැතිනය සමග සාකච්ඡාවලින් අනතුරුව සහ හමුදා කඩා පැනීමේ තර්ජනය ද නිසා බීඩීආර් කැරලිකරුවෝ පසුගිය සතියේ තම කැරැල්ල අත්හැර දැමූහ. පලිගැනීම්වලට බියෙන් බොහෝ දෙනෙක් තම ආයුධ භාර දීමෙන් පසුව පලා ගියහ. බහුතරයක් හමුදා නිලධාරීන් ඇතුලුව අවම තරමින් 70 පිරිසක් කැරැල්ල තුලදී මරනයට ගොදුරු වූහ. සමහරක් විකෘත වූ ඔවුන්ගේ මල සිරුරු බීඩීආර් මූලස්ථානය තුල වලදමා හෝ කානුවල සඟවා තිබී හමුවී ඇත.

කැරැල්ල ගැන විමර්ශනය කිරීම සඳහා ආන්ඩුව පරීක්ෂනයක් නිවේදනය කර ඇත. අගමැතිනිය, එෆ්බීඅයි (එනම් ඇමරිකානු අභ්‍යන්තර ඔත්තු සේවය) මෙන්ම එක්සත් ජාතීන්ගේ සංගමය හා බ්‍රිතාන්‍ය පොලීසියේ ද සහය පැතීය. කෙසේ වෙතත්, අඟහරුවාදා හමුදාව තම ස්වාධීන පරීක්ෂනයක් නිවේදනය කලේ ය. ''පක්ෂග්‍රාහී නොවන පරීක්ෂනයක් පැවැත්වීමට අපට අවශ්‍යය'' බව හමුදා නිලධාරී මන්ඩලයේ හමුදා ප්‍රධානියා වන ලුතිනන් ජෙනරාල් සින ඉබ්නෙ ජමලි වාර්තා කරුවන්ට පැවසුවේය,

හමුදාව විසින් තමන්ගේ ස්වාධීන පරීක්ෂනයක් ඇරඹීමේ තීරනය ආන්ඩුව සහ හමුදාව තුල තියුනු වෙමින් පවතින ආතතිය පිලිබඳ ඇඟවුමකි. බීබීසී වාර්තාවකට අනුව, කැරැල්ල පිලිබඳ හසීනා කටයුතු කල ආකාරය ගැන විරුද්ධ වූ හමුදා නිලධාරීන්ගේ කන්ඩායමක් හමුදාව මගින් කැරැල්ල කුඩු පට්ටම් කල

යුතු බව ඉල්ලා සිටියේය. යුද ටැංකිවල පිටුබලය ලද හමුදා භටයෝ පසුගිය සතියේ බීඩීආර් මූලස්ථානය වට කරමින් පෙරමුන ගත් නමුත් හසීනා ගේ පොරොන්දු කැරලි කරුවන් විසින් පිලි ගත් පසුව ඉවත් වූහ.

වසර 2 ක හමුදා පිටුබලය සහිත ආන්ඩුවකින් අනතුරුව පසුගිය දෙසැම්බර් මස පැවැති මැතිවරනයේ දී හසීනාගේ අවාමි ලීගය දැවැන්ත ජයග්‍රහනයක් ලැබීය. මැතිවරන ප්‍රතිඵල පිලිබිඹු කරන්නේ හමුදාවටත් එහි මර්දනකාරී ක්‍රමවේදයන්ට එරෙහිව පැතිර පැවැතුනු විරුද්ධත්වයයි. බීඩීආර් කැරලිකරුවන්ගේ ඉල්ලීම් පිලිබිඹු කරන්නේ හමුදා නායකයින් කෙරෙහි මෙන්ම භූගෝලීය ආර්ථික අර්බුදය තුල ජීවන තත්වයයන් මත ඇති කරනු ලැබ ඇති බලපෑම ට ඇති විරුද්ධත්වය යි.

තමන්ගේ ම ස්වාධීන පරීක්ෂනයක් ආරම්භක කිරීමේ හමුදා තීරනය සිය අධිකාරය යලි පිහිටුවීමේ ප්‍රයත්නයක් විය හැකි ය. මාධ්‍ය පිටුබලය ඇතිව හමුදාව හිංසාකාරී මැර කල්ලිවලට ක්‍රියාත්මක විය හැකි වාතාවරනයක් කැරලිකරුවන් එරෙහිව උත්සන්න කිරීමට සහ තම අධිකාරය ශක්තිමත් කිරීමට ඝාතනයට ලක් වූ හමුදා නිලධාරීන් ගේ බිය උපදවන සුලු තොරතුරු උපයෝගී කරගත්හ. ඔවුන් ''දේශප්‍රේමීන්'' ලෙස හඳුන්වමින් හමුදාව සහ ආන්ඩුව මරනයට ගොදුරු වූ හමුදා නිලධාරීන්ට පූර්න රාජ්‍ය ගෞරවය පුද කලහ. දින තුනක ජාතික ශෝක කාලයක් ප්‍රකාශ කලහ.

''බංගලිදේශය නිදහස් කරගත්තායින් අනතුරුව එහි පරිමාවෙන් සහ ගැඹුරින් පීල්ඛනා මූලස්ථානවල ඛේදවාෂකය සියලු එවැනි ඝාතන පරයා යයි'', යනුවෙන් අගහරුවාදා ද *නිව් නේෂන්* කතුවැකියක මෙසේ සඳහන් විය. ''එහි ගැඹුර සහ සාහසික ස්වභාවය පීල්ඛානා බීඩීආර් මූලස්ථානයේ සිදු වූ ඛේදවාචකය බංග්ලාදේශය නිදහස් කර ගැනීමෙන් සිදු වූ සියලු ඝාතන ඉක්මවා යයි.'' සෙනසුරාදා ද *ඩේලි ස්ටාර්* සඳහන් කලේ, ''අපගේ සන්නද්ධ හමුදාවල මැනවින් පුහුනු කල නිලධාරින්ගේ විශාලතම ජීවිත විනාශයකට තුඩු දුන් සැලසුම් කරනලද සහ සූදානම් කරනු ලැබ පසුව ඝාතනය කරනු ලැබූ මෙම වැඩ කලින් සැලසුම් කල මිනීමරුවන්ගේ ක්‍රියාවකි.''

කැරලිකරුවන්ට දුන් තම සියලු පොරොන්දු අත් හැරී හසීනා කැරැල්ල ආන්ඩුවට එරෙහි කුමන්ත්‍රනයක් බව දැන් ප්‍රකාශ කර ඇත. ඩකා නුවර සම්මන්ත්‍රනයකට ඊයේ කථා කරමින්, ඇය ''මෙම කැරැල්ල වඩා පුලුල් සැලසුමක කොටසකි. බංගලිදේශයට එරෙහි කුමන්ත්‍රන තවමත් අවසන් වී නොමැත. මෙය රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ස්වාධීනත්වය සහ ස්වෛරීභාවය දුර්වල කිරීමේ කුමන්ත්‍රනයකි.'' යනුවෙන් පවසමින් කැරලිකරුවන් හෙලා දැක්කා ය.

අගමැතිනිය කිසිදු සාක්ෂියක් ඉදිරපත් කලේ නැත. ඒ කෙසේ, වෙතත්, ද *ටයිම්ස් ඔෆ් ඉන්ඩියා* කැරැල්ල ඇවිලවීම සඳහා ව්‍යාපාරිකයකු වන සලාඋදින් කදීර් චෞධරී හවුල් වූ බවට බීඩීආර් රැඳවියන් විසින් පැවසූ බව සඳහන් කරයි. චෞධරී වනාහි හසීනාගේ දීර්ඝ කාලීන දැඩි ප්‍රතිමල්ලවයකු වන විරුද්ධ පක්ෂ නායක බලීඩා සියා ගේ සමීප ආධාර කරුවෙකි.

අගහරුවාදා, නව බීඩීආර් ප්‍රධානියා වන බ්‍රිගේඩියර් ජෙනරාල් මොහොමඩ් මයිනුල් ඉස්ලාම්, *ඩේලි ස්ටාර්* වෙත පැවසුවේ ''බීඩීආර් නිල ඇඳුමින් සැරසී පිටස්තරයින්'' මෙම කැරැල්ලට හවුල් වූ බව ය. වෙනත් නිලධරයකු වූ බ්‍රිගේඩියර් ජෙනරාල් සියාඋල් හසන් වඩා සුපරීක්ෂාකාරීව *ගල්ෆ් නිව්ස්* වෙත ඊයේ පැවසුවේ, ''අපට සහතික වන තුරු හෝ ඔවුන්ගෙන් කෙනෙකු අල්ලා ගන්නා තුරු මෙම ඝාතනය සඳහා නිල ඇඳුමෙන් සැරසී පිටස්තරයින් සහභාගි වූ බව මට ස්ථිර වශයෙන් කිව නොහැකියි'' යනුවෙනි.

ඩකා අගනුවර පුරා පවතින තහවුරු නොකල කුමන්ත්‍රන න්‍යායයන් මගින් කියා පාන්නේ හමුදාවේ සහ ආන්ඩුවේ කන්ඩායමක් කැරැල්ල පිලිබඳව තමන් වෙත එල්ල වී ඇති දෝෂාරෝපනය අවමංගත කිරීම සඳහා පහසු දඩ මීමකු සෙවීමේ මංමුලා සහගත ප්‍රයත්නයක යෙදී සිටින බව ය.

යටි අරමුනු සඳහා බීඩීආර් භටයින් ගේ කැකැරමින් තිබුනු කල කිරීම හැසිරවීමේ හැකියාව මෙමගින් මුලුමනින් ම බැහැර නොකෙරෙයි.

දේශපාලන ආතතීන්ට තෙල් වත්කරන්නේ රටේ පවතින ආර්ථික අර්බුදය විසින් ය යන මූලික කාරනාව සියලුම කුමන්ත්‍රන න්‍යායයන් විසින් නොතකා හරිනු ලබයි. බීඩීආර් කැරලිකරුවන්ට එරෙහිව දැන් ආන්ඩුව සහ හමුදාව විසින් භාවිතා කරන ක්‍රමවේදයන් අනාගතයේ දී තම රැකියාවන් සහ ජීවන තත්වයන් ආරක්ෂා කිරීමට වෙර දරන කම්කරුවන්ට සහ ගොවීන්ට එරෙහිව ද භාවිතා කෙරෙනු ඇත.

© www.wsws.org